# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/29 - 2023 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

08 වන සංශෝධනය

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාව**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2010 සැප්තැම්බර් මස 10 වැනි දිනැති අංක 1670/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**තනුජා මුරුගේෂන්,**
*වැඩබලන ලේකම්,*
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 මාර්තු මස 10 වැනි දින.

***I කොටස***

සංශෝධන අංක 01 - 2011 මාර්තු මස 01 වැනි දින හා අංක 1695/ 15 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02- 2014 ජුනි මස 06 වැනි දින හා අංක 1865/ 36 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03- 2016 අගෝස්තු මස 27 වැනි දින හා අංක 1981/ 99 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04- 2018 මැයි මස 09 වැනි දින හා අංක 2070/7 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 05- 2019 අගෝස්තු මස 22 වැනි දින හා අංක 2137/ 66 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 06- 2021 අප්‍රේල් මස 27 වැනි දින හා අංක 2225/5 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 07- 2021 ජුලි මස 12 වැනි දින හා අංක 2236/5 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

1A - G 39115 — 07 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***II කොටස***

05. වැටුප්

5.1 වැටුප් කේත අංකः ජ්‍යෙෂ්ඨ විධායක - SL-3 -2016
විධායක - SL-1 -2016

5.2 වැටුප් පරිමාණය : ජ්‍යෙෂ්ඨ විධායක - SL-3 -2016 - රු. 88,000-12 x රු. 2,700- රු. 120,400
විධායක - SL-1 -2016 - රු.47,615-10 x රු.1,335-8- රු.1,630-
17 x රු.2,170 - රු. 110,895

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *වැටුප් විස්තර* | *මූලික වැටුප (මාසික)* |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 (SL - 1 - 2016) | රු. 47,615 |
| II ශ්‍රේණිය | 12 (SL - 1 - 2016) | රු. 62,595 |
| I ශ්‍රේණිය | 20 (SL - 1 - 2016) | රු. 76,175 |
| විශේෂ ශ්‍රේණිය | 1 (SL - 3 - 2016) | රු. 88,000 |

6. නිලධාරී ගණයට අයත් තනතුර/ තනතුරු :

6.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

| අනුමත තනතුරු | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| III/ II | 1520 | • තමා වෙත නිශ්චිතව පවරා දෙනු ලබන විෂයය පථයට අදාලව මුදල් රෙගුලාසි හා ඒ සම්බන්ධ සියළු නීති රීති විධිවිධානයන්ට අනුකූල වන පරිදි ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය විධිමත්ව පවත්වාගෙන යාම, තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාල වන්නාවූ තොරතුරු වාර්තාකරණය හා ඒ සඳහා අදාල වන්නාවූ ගිණුම්කරණ හා ඊට අදාළ තොරතුරු වාර්තා සකස්කිරීම හා ඒවා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ලැබීම් ගෙවීම් සම්බන්ධ කටයුතු ඉටුකිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහායවීම, අනුබද්ධ ආයතනවල ගිණුම් කටයුතු හා සම්බන්ධව පවරාදෙනු ලබන කාර්යයන් හා ආයතනයේ ගිණුම්කරණ ක්‍රියාවලියට අදාල වෙනත් කාර්යයන්. |
| I | 489 | • කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම, මූල්‍ය සැලසුම්කරණය හා අයවැය, ගිණුම්කරණය හා වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සුපරීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාට හා මූල්‍ය කටයුතු වලට අදාළව පාර්ලිමේන්තුවට වගකිවයුතු කරුණු සඳහා සහායවීම, අනුබද්ධ ආයතනවල මූල්‍ය කළමනාකරණ මග පෙන්වීම, සුපරීක්ෂණය හා උපදෙස් ලබාදීම හා මූල්‍ය කළමනාකරණ කාර්යය මණ්ඩල පුහුණුව |
| විශේෂ | 93 | |

සටහන : රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම නිලධාරීන් සංඛ්‍යාව වෙනස් විය හැකිය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - III/ II ශ්‍රේණිය - 1520
- I ශ්‍රේණිය - 489

එකතුව - 2009

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.3 සීමිත බඳවා ගැනීම්

7.3.2.3 පලපුරුද්ද :

I. ඉහත 7.2.2 වැනි ඡේදයෙහි දැක්වෙන කවර හෝ සුදුසුකමක් සහිතව සිය පත්වීමෙහි ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ *ගැසට් නිවේදනය* පළකරන දිනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි වැටුප් කේත අංක MN-01-2016 හෝ ඊට සමාන හෝ ඊට ඉහළ කේතයක් යටතේ වැටුප් ලබන සේවයක හෝ තනතුරක වසර පහ (05) කට නොඅඩු අඛණ්ඩ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

II. සිය පත්වීමෙහි ස්ථිර කර ඇති අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය පළකරන දිනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි වැටුප් කේත අංක MN-1-2016 හෝ ඊට ඉහල MN වැටුප් කේත අංකයක් යටතේ හෝ SL-1 වැටුප් කේතය යටතේ වැටුප් ලබන තනතුරක හෝ තනතුරුවල වසර 10 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම

10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරිම

10.3.1 සපුරාලිය යුතු අවශ්‍යතා :

i. 5 වන පරිශිෂ්ඨයේ සඳහන් සුදුසුකම් වලින් එකක් හෝ සපුරා තිබීම.
ii. උසස් කිරීමේ දිනට සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.
iii. උසස් කිරීමේ දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහල මට්ටමක පැවතීම.
v. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
vi. තුන්වන කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම හෝ නිදහස් කර තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයකු සෑම වසරකම ජනවාරි මස 01 හා ජුලි මස 01 දිනට පවත්නා පුරප්පාඩු අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

*සටහන* :

01. පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි 10.3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාවක් පමණි.

02. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාව පරීක්ෂා කිරීම පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් සිදුකරනු ලැබේ.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

14. නිර්වචනඃ

(vi). "සතුටුදායක සේවා කාලය" යන්න අංකඃ 2310/29 හා 2022.12.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින් හි XXII වැනි පරිච්ඡේදයේ XXVIII වන වගන්තිය අනුව අර්ථකථනය වේ.

(x). "සක්‍රිය සේවා කාලය" යන්න අංකඃ 2310/29 හා 2022.12.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින් හි XXII වැනි පරිච්ඡේදයේ XXX වන වගන්තිය අනුව අර්ථකථනය වේ.

(xi). මෙම වගන්තිය ඉවත් කරනු ලැබේ.

(xii). මෙම වගන්තිය ඉවත් කරනු ලැබේ.

EOG 03 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.